# 11 ශ්‍රේණිය සිංහල සාහිත්‍යය

# දියමන්ති මාලය

## 14 ඒකකය




සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)


ආදර්ශ ප්‍රශ්න, පසුගිය විභාග ප්‍රශ්න, විචාර සහ පිළිතුරු අන්තර්ගත කර ඒකකය සම්පූර්ණයෙන් ම ආවරණය කර ඇත.

# 14 පාඩම දියමන්ති මාලය.

01. "දියමන්ති මාලය" කෙටිකතාව රචනා කළ ලේඛකයා නම් කරන්න. ..............................

02. ඔහු උපන් රට නම් කරන්න. ..............................

03. "දියමන්ති මාලය" කෙටිකතාව පරිවර්තනයක් ද අනුවර්තනයක් ද ? ..............................

04. එය සිංහලයට පරිවර්තනය කලේ කවුරුන් ද ? ..............................

05. ඔහු විසින් රචනා කරන ලද නවකතා ගණන කොපමණක් පමණ වේ ද ? ..............................

06. ඔහු විසින් රචනා කරන ලද කෙටිකතා ගණන කොපමණක් පමණ වේ ද ? ..............................

07. ඔහු සිය සාහිත්‍ය ජීවිතය ගොඩනගා ගත්තේ කෙසේ ද ? ..............................

..............................

08. කෙටි කතාවක මූලික ලක්ෂණ මොනවා ද ? ..............................

..............................

..............................

..............................

..............................

09. මෙම කෙටි කතාව රචනා වී ඇති දෘෂ්ටි කෝණය කුමක් ද ? ..............................

10. "දියමන්ති මාලය" කෙටිකතාවේ ප්‍රධාන තේමාව නම් කරන්න. ..............................

..............................

..............................

11. අවස්ථා සම්බන්ධය ලියන්න.

I. "මොනවා....? මං හිත්දා....? ඒ කොහොම ද....?"
..............................
..............................

II. "මටත් ඕක ඕන කෙරුවා නම් එහෙම?
..............................
..............................

III. "ඕකෙන් මට මොකක් කරන්නෙයි කියලා ද කියන්නේ?"
..............................
..............................

IV. "අවුරුද්දේ මේ කාලෙ දි මල් ඇඳීම තමයි අලුත් ම පන්නේ"
..............................
..............................

V. "ඔන්න ඔයාට බඩුවක් තියෙනවා"
..............................
..............................

VI. "කැබ් එකේ නොම්මරය ඔයා ලියා ගත්තා ද?"
..............................
..............................

12. අරුත් පැහැදිලි කිරීම් ලියන්න.

I. දෛවය ..............................
II. මනස්තාපයෙනුත් ..............................
III. පශ්චාත්තාපයෙනුත් ..............................
IV. මහාර්ඝ ..............................
V. සරුවාල ඇඳ ..............................
VI. අන්තර්ගර්භගාර ..............................
VII. අනර්ඝ ..............................
VIII. කැලුම් විහිදු ..............................
IX. රිදීමුවා ..............................
X. ලලනෝපචාරී ..............................
XI. සල්ලාපයන්ට ..............................
XII. දළකාරයො ..............................
XIII. ආහ්ලාදයක් ..............................
XIV. කොපුල් තල ..............................
XV. ප්‍රහර්ෂයෙන් ..............................
XVI. ලාලසාවත් ..............................
XVII. හර්ෂෝන්මාදයෙන් ..............................

# 14 පාඩම දියමන්ති මාලය. - පසුගිය විභාග ප්‍රශ්න

(vii) "මොක ද දැන් ඔයාට වෙලා තියෙන්නේ? දැන් දවස් කුනාඩ වෙලේ ඉඳන් ඔයා ටිකක් අමුතු විදියකට යි ඉන්නේ?"

(අ) මෙහි සඳහන් අයගේ අමුතු හැසිරීමට හේතුව කුමක් ද?

(ආ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ අයගේ නම කුමක් ද?

2019 O/L

---

(vii) "හොඳට ම වැඩි වුණොත් ඒක වට්ටි ප්‍රැන්කු පන්සීයයි"

(අ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළේ කවරෙක් ද?

(ආ) මෙහි 'ප්‍රැන්කු' යනුවෙන් හඳුන්වා ඇත්තේ කුමක් ද?

2018 O/L

6. පවුල් සංස්ථාවේ සමබරතාව ආරක්ෂා කිරීමේ දී ස්වාමි පුරුෂයකුගේ වගකීම මැනවින් නිරූපණය කිරීමට 'දියමන්ති මාලය' කෙටිකතාවේ ලොයිසල්ගේ චරිතය උපයෝගි කරගත් ආකාරය උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

---

(vii) (අ) කේ. ජයතිලක මහතා විසින් රචනා කරන ලද කෙටිකතා සංග්‍රහ දෙකක නම් ලියන්න.

(ආ) 'දියමන්ති මාලය' කෙටිකතාවේ ප්‍රධාන චරිතය කුමක් ද?

(i) "ඇවි, එදා ඔයාට හම්බු වෙලා කථා බස් කරලා ගිය දවසෙ ඉඳන් අද වන තුරු මම වින්ද කරදර හිරිහැර අනන්තයි. අප්‍රමාණයි. ඉතින් ඒ ඔක්කෝම මං වින්දෙ ඔයා නිසා"

(අ) මෙය ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් කා හට ද?

(ආ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

2017 O/L

---

(ix) (අ) 'දියමන්ති මාලය' කෙටි කතාවේ මුල් රචකයාගේ නම ලියන්න.

(ආ) නිර්දිෂ්ට 'දියමන්ති මාලය' කෙටි කතාව සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද්දේ කවුරුන් විසින් ද?

2016 O/L

6. සාමාන්‍ය සමාජයේ ජීවත් වන මිනිසුන්ගේ ජීවිතවල යථා ස්වභාවය නිරූපණය කිරීමට 'දියමන්ති මාලය' කෙටි කතාකරුවා සමත් වී ඇති ආකාරය උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

---

01 "ඇත්ත නෝන්නං ! මට එහෙම එකක් ගැන කල්පනාවක් වුනේ ම නැනේ. "

(අ) මෙසේ ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ආ) මෙය උපුටාගත් පාඩමේ නම ලියන්න.

Term test

02 "මීට කලින් තේද මෙක ගෙනත් දෙන්න තිවුණේ? "

(අ) මෙය ශ්‍රවණය කළේ කවුද?

(ආ) මෙහි 'මේක' යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?

03 'හොඳයි මං ඔයාට දෙන්නම් ප්‍රැන්කු හාරසීයයක් ලස්සන ඇඳුමක් ගන්න උත්සාහ කරල බලන්න.'

(අ) මෙම ප්‍රකාශය කරන්නේ කාට ද?

(ආ) මෙම ප්‍රකාශය කරන පුද්ගලයා තුළ දක්නට ලැබෙන ගුණාංගය කුමක් ද?

04 ''දියමන්ති මාලය'' කෙටිකතාවෙහි එන මැටිල්ඩා, (ලකුණු 15)

(අ) සිහින ලොවක ජීවත් වී

(ආ) සැබෑ ලොවට පිය මං කරන අයුරු

අපූර්ව ආකාරයෙන් ඉදිරිපත් කිරීමට කතුවරයා සමත් වූ ආකාරය එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන පැහැදිලි කරන්න.

---

**01.** දියමන්ති මාලය නැති වීමට පෙර සිහින ලෝකයක ජීවත් වූ මැටිල්ඩා පසු ව සැබෑ ලෝකයේ කටයුතු කල ආකාරය පැහැදිලි කරන්න.

**02.** දියමන්ති මාලය කෙටිකතාවේ "මැටිල්ඩාගේ සැමියා වන ලොයිසල් යහපත් සැමියෙකි." ඔබේ අදහස් දක්වන්න.

**03.** මෙම කෙටිකතාවෙහි අන්දකීම ප්‍රකාශ කිරීම සඳහා අවස්ථා හා සිද්ධි නිරූපණය කර ඇති ආකාරය සාකච්ජා කරන්න.

**04.** කතුවරයා කෙටිකතාවේ චරිත සජීවී ලෙස නිරූපණය කර ඇති ආකාරය සාකච්ජා කරන්න.

- දියමන්ති මාලය නැති වීමට පෙර සිහින ලෝකයක ජීවත් වූ මැටිල්ඩා පසු ව සැබෑ ලෝකයේ කටයුතු කළ ආකාරය පැහැදිලි කරන්න.

ප්‍රංශ කෙටිකතා සම්ප්‍රදායේ මුදුන් මල්කඩ ලෙස සැලකෙන ගී ද මෝපසං විසින් රචිත 'දියමන්ති මාලය' ඉතා උසස් ගණයේ කෙටිකතාවක් ලෙස විචාරක පැසසුමට ලක් වූ කෙටිකතාවකි. ව්‍යාජ දියමන්ති මාලයක් සැබෑ දියමන්ති මාලයක් යැයි උපකල්පනය කොට මධ්‍යම පාංතික යුවලකට සිදු වූ අනුවේදනීය ඛේදවාචකයක් මෙම කෙටිකතාවට වස්තු විෂය වී ඇත.

කෙටි කතාවේ ප්‍රධානම චරිතයක් වන මැටිල්ඩා විවාහ වී සිටියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ සුළු ලිපිකරුවෙකු වූ ලොයිසෙල් මහතා සමඟිනි. තමා විවාහ වූ මුල් අවදියේ සිටම අසංතෝෂයෙන් කාලය ගත කරන ඇය සිහින ලෝකයක ජීවත් වූවා ය. එය අපූරු ලෙස ඉදිරිපත් කරන කතුවරයා ඇගේ සිතිවිලි ඔස්සේ එය මැනවින් විවරණය කරයි.

'අනර්ඝ කෞතුක වස්තුන්ගෙන් පිරුණා වූ සූක්ෂ්ම කර්මාන්තයන්ගෙන් හෙබි ගෘහ භාණ්ඩවලින් ද එල්ලන ලද පුරාණ සේද තිර රෙදිවලින් විචිත්‍ර වූ අතිවිශාල ශාලා ද, .... ප්‍රිය සමාගමය සඳහා ම වෙන් කරන ලද සුගන්ධවත් සුන්දර ආගාර ද සිතින් මවා ගත් ඈ ඒවා පිළිබඳ කල්පනාවෙන් මනෝලෝකයක ජීවත් වූවා ය.'

ඇය ගත කළ මනෝ ලෝකය ඇයටම ආවේණික වූවකි. ඇය මනෝ ලෝකයේ අතරමං වී සිටි අවස්ථාවක රාත්‍රී ආහාරය සඳහා වාඩි වූ ඇගේ සැමියා සුප් බඳුනෙහි වැහුම් අරිමින් මහත් ප්‍රබෝධයකින් ප්‍රීති රාවයක් නගන විටත් ඇය කිසිදු ප්‍රතිචාරයක් නොදක්වයි. එසේ ප්‍රතිචාර නොදක්වන ඇය සිහින ලොවක සිතිවිලි දාමයක අතරමං වී සිටින ආකාරය කතුවරයා මැනවින් පසක් කර ඇත්තේ මෙසේය.

'අද්භූත පක්ෂීන්ගේ රූප සටහන්වලින් පිරුණු වර්ණවත් තිරරෙදි ගැන ය. කාන්තියෙන් කැලූම් විහිදූ රිදීමුවා බඳුන් ගැන ය. ප්‍රණීත ආහාර පාන ගැන ය.'

එක් දිනක් සැමියාගෙන් ලැබෙන ආරාධනා පත්‍රයක් කියවන ඈ උත්සවයකට යාම සඳහා ආබරණයක් ඉල්ලා ගැනීමට තම සැමියාගේ මතක් කිරීම මත තම යෙහෙළියක වූ ෆොරෙස්ටියර් මහත්මිය හමුවීමට යයි. එහිදී දියමන්ති මාලයක් යැයි සිතා ව්‍යාජ මාලයක් රැගෙන එන ඇය උත්සවය අවසන් වී පැමිණෙන විට මාලය නොමැති බව දැන ගනියි. එතැන් සිට පෙර සිහින ලෝකයක ජීවත් වූ ඇය සැබෑ ලෝකයට පිවිසෙයි. නැති වූ මාලය වෙනුවට අලුත් මාලයක් මිලදී ගැනීමට අධික ලෙස පොළී අය කරන්නන්ගෙන් මුදල් ණයට ගනියි. විවිධ බැඳුම්කරවලට එළඹෙයි. කෙසේ හෝ නැති වූ මාලයට සමාන මාලයක් තම මිතුරියට රැගෙන දුන්නද ඉන් පසු වසර දහයක් පමණ ණය ගෙවීමට අප්‍රමාණ දුක් විඳීමට ලොයිසෙල් පවුලට සිදු වෙයි. ඇය සැබෑ ජීවිතය තුළ විඳි දුක් ගැහැට, ජීවත් වීමට වෙර දැරූ ආකාරය කතුවරයා සජීවී ලෙස නිරූපණය කරන්නේ පාඨක සිතට සංවේගයක් ද පහළ කරමිනි.

'ඈ තෙල් සහිත හැළි වළන් ද වෙනත් මැටි බඳුන් ද පිඟන් කෝප්ප හා දීසි පීරිසි ද තම රෝස පැහැති නිය ගෙවී යන තුරු සේදුවා ය. කිළිටි රෙදි පෙරදි ද කමිස හා වෙනත් ඇඳුම් පැළඳුම් ද සේදූ ඈ, ඒවා වැලක වැනුවා ය.'

තම සේවිකාව අස් කර දමූ ඈ එලෙස ගෙදර දොර සියලු වැඩ කටයුතු කිරීමට පෙළඹුනේ දියමන්ති මාලය නැති වූ පසුවය. දියමන්ති මාලය නැති වීමට පෙර සිහින ලොවක ජීවත් වූ මැටිල්ඩා ජීවිතයේ සැබෑ අත්දැකීම් විඳින්නේ ඇගේ ජීවිතයේ පරිණත අවධියේදීය. මෙලෙස ඇගේ චරිතය තුළින් සැබෑ ජීවන මං හසර විවරණය කිරීමට කෙටිකතාකරුවා සමත් වී ඇත්තේය.

උදාහරණ සඳහා ලකුණු 03 යි.
සමස්ත විස්තරයට ලකුණු 07යි.
මුළු ලකුණු 10 යි.

- 'දියමන්ති මාලය' කෙටිකතාවේ මැටිල්ඩාගේ සැමියා වන ලොයිසල් යහපත් සැමියෙකි. ඔබේ අදහස් දක්වන්න.

ප්‍රංශ කෙටිකතා සම්ප්‍රදායේ මුදුන් මල්කඩ ලෙස සැලකෙන ගී ද මෝපසං විසින් රචිත 'දියමන්ති මාලය' ඉතා උසස් ගණයේ කෙටිකතාවක් ලෙස විචාරක පැසසුමට ලක් වූ කෙටිකතාවකි. ව්‍යාජ දියමන්ති මාලයක් සැබෑ දියමන්ති මාලයක් යැයි උපකල්පනය කොට මධ්‍යම පාංතික යුවලකට සිදු වූ අනුවේදනීය ඛේදවාචකයක් මෙම කෙටිකතාවට වස්තු විෂය වී ඇත.

කෙටි කතාවේ ප්‍රධානම චරිතයක් වන මැටිල්ඩා විවාහ වී සිටියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ සුළු ලිපිකරුවෙකු වූ ලොයිසෙල් මහතා සමඟිනි. සිය බිරියගේ ඒකාකාරී දිවියෙන් මඳක් හෝ වෙනසක් කළ යුතු යැයි අපේක්ෂා කරන ලොයිසෙල් මහතා එක්තරා සන්ධ්‍යාවක ලොකු ලියුම් කවරයක් මැටිල්ඩාට ලබා දෙන්නේ ඉමහත් සතුටිනි. බිරිඳගේ සතුට වෙනුවෙන් ක්‍රියා කරන සැමියෙකුගේ යහපත් චරිතයක් මෙලෙස ලොයිසෙල් තුළින් නිරූපණය කිරීමට කතාව ආරම්භයේදීම කතුවරයා සමත් වෙයි.

"ඔන්න ඔයාට බඩුවක් තියෙනවා,'යි ඔහු කී ය."

එහි සටහන් වන්නේ අධ්‍යාපන අමාත්‍යවරයා සහ මැතිනිය ලොයිසල් මහතාට හා එම මැතිනියට උත්සවයකට ආරාධනා කළ කාඩ් පතකි. මෙම කාඩ් පත කියවා බැලූ ඇ, සැමියා බලාපොරොත්තු වූ අන්දමින් ප්‍රමෝදයට පත් වනු වෙනුවට අවඥාවෙන් එය මේසය මතට විසි කර දමුවා ය. එහෙත් කෝප නොවන ලොයිසෙල් ඒට කරුණු විමසීමට තරම් කාරුණික වෙයි. ඇයට සුදුසු ඇඳුමක් නොමැති වීම ඒට හේතුව බව දැන ගන්නා ඔහු තම මිතුරන් සමඟ වටුවන් වෙඩි තැබීම සඳහා ඊළඟ ග්‍රීෂ්ම ඍතුවේ යන අදහසින් තුවක්කුවක් මිල දී ගැනීමට ඉතිරි කර ගෙන තිබූ මුදල තම බිරිඳට ලබා දෙයි.

"එ සේ වුව ද ඔහු, 'හොඳ යි, මං ඔයාට දෙන්නම් ෆ්‍රැන්කු හාර සීයක්. ලස්සන ම ඇඳුමක් ගන්න උත්සාහ කර ලා බලන්න,' යි කී ය."

තම සතුට පසෙක ලා තම බිරියගේ සතුට උදෙසා සිදු කළ එවැනි කැප කිරීමක් සියළු ස්වාමි පුරුෂයන්ට කළ හැක්කක් නොවේ. මැටිල්ඩා විසින් උත්සවයට යාම සඳහා ආබරණයක් ඉල්ලා ගැනීමට තම සැමියාගේ මතක් කිරීම මත තම යෙහෙළියක වූ ෆොරෙස්ටියර් මහත්මිය හමුවීමට යයි. එහිදී දියමන්ති මාලයක් යැයි සිතා ඇය ව්‍යාජ මාලයක් ගෙන එන විත් එය පැළඳ උත්සවයට සහභාගී වෙයි. උත්සවය අවසන් වී පැමිණෙන විට ලොයිසෙල්ගේ මුවට නංවන ප්‍රේමනීය වදන් වලින් ඔහු තුළ පැවති යහගුණ ධර්ම සේම සිය බිරියට ඇති ආදරයත් සෙනෙහසත් මනාව විදහා පෑමට කතුවරයා සමත් වෙයි.

"ටිකක් ඉන්න, මැටිල්ඩා, එළියට බැස්සොත් හෙම්බිරිස්සාවක් එහෙම හැදෙන්න පුළුවනි. මං ගිහිල්ලා කැබ් එකක් අරන් එනකං ටිකක් ඉන්න."

උත්සවය අවසන් වී නිවසට පැමිණි පසු මාලය නැති වී ඇති බව මැටිල්ඩා පවසයි. එතැන් සිට නැති වූ මාලය වෙනුවට අලුත් මාලයක් මිලදී ගැනීමට අධික ලෙස පොලී අය කරන්නන්ගෙන් මුදල් ණයට ගැනීමට ලොයිසෙල් පවුලට සිදු වෙයි. කෙසේ හෝ නැති වූ මාලයට සමාන මාලයක් රැගෙන දුන්නද ඉන් පසු වසර දහයක් පමණ ණය ගෙවීමට අප්‍රමාණ දුක් විඳීමට ඔවුන්ට සිදු වෙයි. එහෙත් කිසිඳු අවස්ථාවක තම බිරිය නිතිි කිරීමට හෝ ඇයට දොස් පැවරීමට ලොයිසෙල් ක්‍රියා නොකරයි. මෙලෙස ක්‍රියා කළ ලොයිසෙල් ලිපිකරුවාගේ චරිතය තුළින් මානව වාදී යහගුණ සමුදායකින් පිරි චරිතයක් විනිවිද දැකීමට පාඨකයාට ඉඩ සැලසීමට ගී ද මෝපසං කෙටිකතාකරුවා සමත් වී ඇත්තේය.

උදාහරණ සඳහා ලකුණු 03 යි.
සමස්ත විස්තරයට ලකුණු 07යි.
මුළු ලකුණු 10 යි.

# 14 පාඩම දියමන්ති මාලය. - පිළිතුරු

01 ගී ද මෝපසං.

02 ප්‍රංශය.

03 පරිවර්තනයකි.

04 කේ. ජී. කරුණාතිලක.

05 9 ක්.

06 300 ක්.

07 විවිධ සාහිත්‍ය සභා වලට සහභාගී වීමෙන්.

08

- පාඨකයාට ආස්වාදයක් මෙන්ම ගැඹුරු ප්‍රඥාවක් හිමි වීම.
- ප්‍රධාන චරිත එකක් පමණක් තිබීම.
- මනා හේතුව ඵල සම්බන්ධයක් මත ගොඩනැගුණු කතාව වින්‍යාසයක් තිබීම.
- සංකේත භාවිතය.
- පරිසර වර්ණනා තිබීම.
- යථාර්ත නිරූපණය.
- සංක්ෂිප්ත බව.
- කිසියම් දෘෂ්ටි කෝණයකින් රචනා වීම.

09. උත්තම පුරුෂ දෘෂ්ටි කෝණය.

10 මධ්‍යම පාන්තික ලිපිකරුවෙකු වූ ලොයිසෙල් හා ඔහුගේ බිරිඳ වන මැටිල්ඩා විසින් තමන් නැති කර ගත් මාලය දියමන්ති මාලයකැයි සිතා වසර 10 ක් පමණ අප්‍රමාණ දුක් විඳීම පිළිබඳ අනුවේදනීය තේමාව.

11

1. ෆොරෙස්ටියර් මහත්මිය විසින් මැටිල්ඩාට. වසර දහයකට පසු මැටිල්ඩා විසින් ෆොරෙස්ටියර් මහත්මිය හමුවූ අවස්ථාව
2. ෆොරෙස්ටියර් මහත්මිය විසින් මැටිල්ඩාට. මැටිල්ඩා දියමන්ති මාලය ප්‍රමාද වී ෆොරෙස්ටියර් මහත්මියට ලබා දුන් අවස්ථාව
3. මැටිල්ඩා විසින් ලොයිසෙල් මහතාට. මැටිල්ඩා විසින් සියලූ සැමියා ලබා දුන් ආරාධනා පත්‍රය කියවූ අවස්ථාව.
4. ලොයිසෙල් මහතා විසින් මැටිල්ඩාට. මඇටිල්ඩා විසින් පාටියට යාමට ආබරණ නොමැති බව කිවූ අවස්ථාව.
5. ලොයිසෙල් මහතා විසින් මැටිල්ඩාට. තමා විසින් රැගෙන ආ ලොකු ලියුම් කවරය මැටිල්ඩාට දුන් අවස්ථාව.
6. ලොයිසෙල් මහතා විසින් මටිල්ඩාට. මාලය නැති වූ බව මැටිල්ඩා විසින් කියූ විට කළා ප්‍රකාශයකි.

12

01. ඉරණම
02. සිතියම තැවීමෙනුත්.
03. පසුතැවිල්ලෙනුත්.
04. ඉතා වටිනා.
05. කොට කලිසමට සමාන ඇඳුම් ඇඳ.
06. ඇතුළු කාමර.
07. වටිනා.
08. කාන්තිය විහිදූ.
09. රිදීයෙන් කළ.
10. කාන්තා හැසිරීම් ගැන.
11. කතා වලට.
12. සමාජයේ උසස් යැයි සම්මත අය.
13. සතුටක්.
14. කම්මුල් පෙදෙස.
15. සතුටින්.
16. අධික ආශාවෙන්.
17. ප්‍රීතියෙන් උමතුව.

# 14 පාඩම දියමන්ති මාලය. - පසුගිය විභාග ප්‍රශ්න - පිළිතුරු

**2019 O/L**

(vii) (අ) දියමන්ති මාලය කෙටි කතාවේ මැටිල්ඩාට අධ්‍යාපන අමාත්‍යාංශ මන්දිරයේ පැවැත්වෙන උත්සවයට පැළඳ ගෙන යාමට කිසිදු ආභරණයක් නොමැති වීම

(ආ) මැටිල්ඩා, ලොයිසල් මැතිනිය, ලොයිසල්ගේ බිරිඳ, මැටිල්ඩා ලොයිසල්

---

**2018 O/L**

(vii) (අ) මැටිල්ඩා / ලොයිසල් මහත්මිය

(ආ) ප්‍රංශයේ ව්‍යවහාර මුදල් ඒකකය / මුදල් ඒකකයක්

---

**2017 O/L**

(vii) (අ) අභිරණය, කටු සහ මල්, එක ගෙයි අවුරුද්ද, වජිර සම්මත, පුනරුත්පත්තිය හා තවත් කෙටි කතා, නොනිමි සිත්තම හා තවත් කෙටිකතා, දියණිය ආපසු එයි.

(ආ) මැටිල්ඩා / ලොයිසල් මහත්මිය.

(i) (අ) මැටිල්ඩා ලොයිසල් විසින් ෆොරෙස්ටියර් මැතිනියට.

(ආ) එක්තරා ඉරිදා උදෑසනක මැටිල්ඩාට ෆොරෙස්ටියර් මහත්මිය හමු වූ අවස්ථාවේ මැටිල්ඩා ලොයිසල් මහත්මිය විසින් ෆොරෙස්ටියර් මහත්මියට කරන ලද ප්‍රකාශයකි.

---

**2016 O/L**

(ix) (අ) හී ද මෝපසාං

(ආ) කේ.පී. කරුණාතිලක

- ★ සමාජයේ ජීවත් වන මිනිසුන්ගේ ජීවිතවල යථා ස්වභාවය නිරූපණය කිරීම සාර්ථක කෙටි කතාවක ලක්ෂණයකි.
- ★ මිල මුදල් අග හිඟ දුෂ්කරතා තිබුණද, සෑම ගැහැනියක ම අන් අය ඉදිරියේ කැපී පෙනෙන ආකාරයට ජීවත් වීමට කැමති බව හෙළි වීම.

  නිදසුන් : "පොහොසත් ගෑනු මැද්දේ දුප්පත් විදියට ඉන්න එක තරම් ලැජ්ජා නැති වැඩක් නෑ,
  "කණේ කරේ දා ගන්න මුතුත් ම නැතිකම ගැනයි මං මේ දවස් ටිකේම කල්පනා කර කර හිටියේ. මේක මගේ හිතට ලොකු අමාරුවක්"
- ★ නොසිතූ කරදරයක් වූ අවස්ථාවක දී ණය වීම.
- ★ මැටිල්ඩා තම යෙහෙළිය වූ ෆොරෙස්ටියර් මහත්මියගෙන් ඉල්ලා ගත් දියමන්ති මාලය නැති වූ විට ණයට හා පොලියට මුදල් ලබා ගෙන මාලයක් මිල දී ගෙන එය භාර දී එම ණය සහ පොලී මුදල් ගෙවීම සඳහා දිවා රෑ නොබලා වෙහෙසීම.
- ★ ණය බරින් මිරිකුණත් ඒ බව සමාජයට නොඅඟවා ජීවත් වීම.
- ★ තමාට නොගැළපෙන විවාහයක් කර ගැනීමට සිදු වීම පිළිබඳව මානසිකව පසු තැවීම.
- ★ තමාගේ දුක්, කරදර හා අසන්තෝෂය පිටතට නොපෙන්වා ජීවත් වීමට උත්සාහ ගැනීම.
- ★ තම බිරිඳගේ රූමත්කම පිළිබඳව අන් අයට ප්‍රදර්ශනය කිරීමට සැමියා තුළ ඇති කැමැත්ත.
- ★ සෑම අයෙකුම තමා ජීවත් වන සමාජ තලයට වඩා ඉහළ සමාජ තලයක අය ඇසුරු කිරීමට කැමති බව, මධ්‍යම පාන්තික ආකල්ප.
- ★ දිවා රෑ නොබලා වෙහෙස මහන්සි වී වැඩ කළත් අඩු ආදායමක් ඉපයීම.

  "ඇගේ සැමියා සවස් කාලයේදී කිසියම් වෙළෙන්දෙකුගේ ගිණුම් වාර්තා සකස් කිරීමෙහි යෙදුණේ ය. බොහෝ විට රාත්‍රී කාලය ඔහු ගත කළේ පැන්ස බාගයකට පිටුව ගණයෙන් පිටපත් කිරීමෙනි"
- ★ සැමියා බිරිඳගේ සතුට වෙනුවෙන් කටයුතු කිරීම.

  (ප්‍රිය සම්භාෂණයට සහභාගි වීමේ අවස්ථාව ලබා ගැනීම. ඇයට අවශ්‍ය ඇඳුමක් ලබා ගැනීමට මුදල් දීම.)

මෙයින් උදාහරණ තුනක් ඉදිරිපත් කර තිබේ නම් සාර්ථක පිළිතුරක් සේ පිළිගන්න.

**උදාහරණ සඳහා ලකුණු 03 යි**
**සමස්ත විස්තරයට ලකුණු 07 යි**
**මුළු ලකුණු 10 යි**

---

**Term test**

**01 මැටිල්ඩා විසින්, දියමන්ති මාලය**
**02 ෆොරෙස්ටියර් මහත්මිය, දියමන්ති මාලය**
**03 මැටිල්ඩාට, අරපිරිමැස්ම (පිටුව 113)**